# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/MF/08/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ........................ | දිනය<br>திகதி<br>Date | 2025.06.07 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/03 ට පලමු එකතුව**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,**

**<u>ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති සඳහා මූල්‍ය පාලනය හා මූල්‍ය සීමාවන් පිළිබඳ බලතල පැවරීම.</u>**
**<u>මාසික ගමන් වියදම්, දින වැටුප් හා අතිකාල දීමනාව හා පරිගණක පුහුණුලාභීන් සඳහා දෛනික දීමනා ගෙවීම් කිරීම.</u>**

01. සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරි (කලාප සහකාර) සඳහා ගමන් වියදම් ගෙවීම.

1.1 සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් (කලාප සහකාර) යන නිලධාරින් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදල් තුලින් ගෙවනු ලැබූ මාසික ගමන් වියදම් දීමනාව මා විසින්, 2025.04.25 දින නිකුත් කරන ලද සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක 01/2025 (1) මඟින් ලබාදුන් උපදෙස් මත 2025.05.01 දින සිට මහා භාණ්ඩාගාර ප්‍රතිපාදනය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි අංශය හරහා ගෙවීම් කරනු ලැබේ.

එබැවින්, මෙම නිලධාරින් සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/03 ඡේද අංක 2.2 හි සඳහන් පරිදි සමෘද්ධි ප්‍රජාමූල බැංකු අරමුදලින් ලබා දීම, මෙම චක්‍රලේඛය මඟින් අත්හිටුවනබව දන්වමි.

1.2 ඒ.අනුව, 2025 මැයි මස සිට ඉදිරියට අදාල නිලධාරින් විසින් ගමන් වියදම් ඉල්ලීම සමෘද්ධි මූලස්ථානයට ඉදිරිපත් කර ලබා ගැනීමට කටයුතු කල යුතුය. කිසිදු විටක, භාණ්ඩාගාර ප්‍රතිපාදන හා සමෘද්ධි බැංකු අරමුදල් යන අරමුදල් 02කම තුලින් ගමන් වියදම් ලබාගැනීම නොකල යුතු බව ද දන්වමි. එසේ සිදු කිරීම මූල්‍ය අවභාවිතයක් බව ද අවධාරණය කරමි.

1.3. ගමන් වියදම් ලබා ගැනීමට සුදුසුකම් ලබන අනෙකුත් කළමණාකරුවන් ඇතුළු සියළු නිලධාරින් සඳහා මාසික ගමන් වියදම් දීමනා ගෙවීම සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක 01/2025 (1) හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/03 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

02. සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති නිලධාරින් සඳහා දින වැටුප් හා අතිකාල දීමනා ගෙවීම.

2.1 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025.03.25 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපදෙස් පරිදි නව වැටුපට අනුව දින වැටුප් හා අතිකාල දීමනා ගණනය කර, ගෙවීම කලයුතු ආකාරය පිළිබඳ උපදෙස් මා විසින් 2025.04.25 දින නිකුත් කරන ලද සමෘද්ධි ගිණුම් චක්‍රලේඛ අංක 01/2025 (1) හි සඳහන් කර ඇත.


**1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

ඒ අනුව, සමෘද්ධි ප්‍රජාමූල බැංකු / බැංකු සමිති අරමුදලින් ගෙවනු ලබන දින වැටුප් හා අතිකාල දීමනා ගණනය කිරීමට කටයුතු කලයුතු බව ද දන්වමි.

2.2 අතිකාල දීමනා ගණනය කිරීමේදී මා විසින් නිකුත් කරන ලද 01/2025 (1) චක්‍රලේඛයේ 29 ඡේදයේ සඳහන් පරිදි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි 5.1 මගින් ලබාදී ඇති උපදෙස් පරිදි ගණනය කලයුතු අතර, දින වැටුප් ගෙවීමේදී 5.2 ඡේදයේ සඳහන් පරිදි නිලධාරියාගේ මාසික මූලික වැටුපෙන් 1/30 ක් විය යුතු බව දන්වමි.

2.3 මෙම නව දීමනාවන් වලංගු වනුයේ, 2025.04.01 දින සිට ක්‍රියාත්මක කරනු ලබන නව වැටුප් සංශෝධනය පදනම් කරගෙන බවද තවදුරටත් දන්වමි.

2.4. මාසික ගමන් වියදම් මුදල , දින වැටුප් ගණන, අතිකාල පැය ගණන් පිළිබඳ දී ඇති සීමාවන් නොවෙනස් වේ.

03. සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2025/3 හි 5.18 උප ඡේදයේ සඳහන් පරිගණක පුහුණු ලාභියෙකුට ගෙවනු ලබන දෛනික දීමනාව, 2025.06.04 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2017 (ii) පරිදි 2025.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ( සමෘද්ධි ප්‍රජාමූල බැංකු /බැංකු සමිති) රු1000/- ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව පරිසණක පුහුණු ලාභින්ගේ දීමනා ගෙවන ලෙස දන්වමි.

මෙම දෛනික දීමනාව සංශෝධනය කිරීමත් සමග වෙනත් අමතර දීමනාවක් ලබාදීම නොකල යුතුය. තවද පුහුණු ලාභින් බඳවා ගැනීම හා ඉටුකරගතයුතු කාර්යයන් පිළිබඳ දැනට දී ඇති උපදෙස් තවදුරටත් වලංගු වේ.

04. සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්ට දැනට ගෙවනු ලබන අතට පාඩු දීමනා මුදල සංශෝධනය නොවන අතර, මේ සම්බන්ධව ඉදිරියේදී අදාල තීරණ ලබාගෙන දැනුම්දීමට කටයුතු කරන බව ද, දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය -කා.දැ.පි.
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
   - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පාලන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි
4. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
6. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -කා.දැ.පි.හා අ.ක.ස
7. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.පි.හා අ.ක.ස
8. සභාපති, සමෘද්ධි ප්‍රජාමූල බැංකු මහ සංගමය - කා.දැ.පි.